#mediaethicsSL #Sinhalanews #TVchannels #lka #HiruTv

කම්පනය ඇති කරවන ආකාරයේ ප්‍රචණ්ඩ සිදුවීමක් සම්බන්ධ ඡායාරූප හෝ වීඩියෝ පට ප්‍රචාරය කිරීමේදී ඒ සම්බන්ධයෙන් ජනමාධ්‍ය සුවිශේෂී සැලකිල්ලකින්, විචාර බුද්ධියකින් සහ සංවේදීතාවයකින් කටයුතු කළ යුතු බව නොකිවමනායි. ඇතැම් ප්‍රේක්ෂකයින් විසින් අපගේ අවධානයට ලක් කළ ආකාරයට, පසුගිය දිනක සිදුවූ අමානුෂික පහරදීමක් සම්බන්ධ ප්‍රවෘත්තියක් සමගින් ජංගම දුරකතනයකින් රූගත කොට තිබූ එම පහරදීමේ වීඩියෝ දර්ශනද හිරු රූපවාහිනී නාලිකාව ඔස්සේ ප්‍රචාරය කෙරුණු බව අපගේ නිරීක්ෂණයට ලක් විණි. මෙය ප්‍රචාරය කිරීමට පෙරාතුව රූපවාහිනී නාලිකාව මගින් අනතුරු හැඟවීමක්ද ප්‍රචාරය කරන්නට කටයුතු කොට තිබිණි. එයින් කියැවුණේ 'අවවාදයයි...! කුඩා ළමුන් සහ සුළු දෙයටත් බියට පත්වන පුද්ගලයින්, හෘද රෝග සහිත පුද්ගලයින් සහ නැරඹීමෙන් පසුව ආතතික තත්වයට පත්වන පුද්ගලයින් මෙම ප්‍රවෘත්තිය නැරඹීමේදී සැලකිලිමත්වන්න' යන්නයි. ඉන් අනතුරුව තත්පර පහක අවරෝහණ ගණන් කිරීමකින් අනතුරුව එම පහර දීමේ දසුන විකාශය වෙයි. මෙවැනි සංවේදී දර්ශනයක් පෙන්වීමට පෙර අනතුරු හැඟවීමක් විකාශය කිරීම සැබවින්ම සැලකිල්ලකින් සහ විචාර බුද්ධියකින් යුතුව කටයුතු කිරීමක් බව කිව යුතුවේ. එනමුත් ප්‍රවෘත්ති විකාශනයන් තුළ මෙවන් දර්ශනයන් අන්තර්ගත වීම අවශ්‍ය වේද? එමගින් කිසියම් හෝ ධනාත්මක කරුණක් සමාජගත වන්නේද? ඒ සම්බන්ධයෙන් ප්‍රේක්ෂක ඔබේ අදහස කුමක්ද?